# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2189/37 - 2020 අගෝස්තු මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ATU/LND/04/DO45.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/2/2016/HA90.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හවුපෙ ගමේ පිහිටි මාතර සර්වේයර් ජනරාල්ගේ අ.ග.පි 73 අතිරේක අංක 4 දරන අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන පහත දැක්වෙන ඉඩම :

**කැබලි අංකය 42**
ඉඩමේ නම: ගල්කැටියගොඩ යක්දෙලියඕවිට හිනගමගෙයද්දෙලිය ගෙවත්ත; ඉඩමේ විස්තර: ගෙවත්ත මිශ්‍රභෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: විහාරාධිපති, ශ්‍රී බෝධිරුක්කාරාමය, හවුපේ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0264.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 සැප්තැම්බර් මස 21 වැනි දින පෙ.ව. 10.00 ට අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2020.09.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති සියළු ඔප්පු තිරප්පු හා වෙනත් ලියවිලි විභාගයට ඉදිරිපත් කළ යුතුය.

නිරෝෂා එස්. ගමගේ,
ප්‍රාදේශීය ලේකම්,
අතුරලිය.

2020 අගෝස්තු මස 17 වැනි දින,
අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09-104